# මූල්‍ය ප්‍රකාශන විගණනයන් සඳහා තත්ත්ව පාලනය (S.L.Au.S 220)

- හැඳින්වීම
- තත්ත්ව පාලනය යනු කුමක්ද ?
- තත්ත්ව පාලනයට අදාළ වන පියවර
- තත්ත්ව පාලනයේ වාසි

## හැඳින්වීම

සෑම විගණන ආයතනයක්ම තම වෘත්තීමය සේවාවන් සැපයීමේදී තමා සැපයීමට බලාපොරොත්තු වන වෘත්තීමය සේවාවන් වල ගුණාත්මක භාවය වර්ධනය කිරීමට උත්සහ කළ යුතු වේ.

- විගණන ආයතනය සමස්ථයක් ලෙස ගත් කල
- එක් විගණනය වෙන් වෙන් වශයෙන් ගත් කළ

## තත්ත්ව පාලනය යනු කුමක්ද ?

විගණන ආයතනයක් සපයනු ලබන සේවාවන් වල ගුණාත්මකභාවය  ඉහළ නැංවීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටි, වැඩසටහන්, තත්ත්ව පාලන පිළිවෙත් ලෙස හඳුන්වයි.

### කාර්යභාර හවුල්කරු

අදාළ විගණන කාර්යභාරය, එහි ක්‍රියාකාරීත්වය, අදාළ විගණන ආයතනය වෙනුවෙන් නිකුත් කරන ලද විගණන වාර්තාව සඳහා වගකීම දරන විගණන ආයතනයේ හවුල්කරුවකු හෝ වෙනත් පුද්ගලයෙකු කාර්යභාර හවුල්කරුවකු ලෙස හඳුන්වයි.

### කාර්යභාර තත්වපාලන සමාලෝචනය

විගණන  වාර්තාවේ දිනයට පෙර අදාළ විගණන කණ්ඩායම එළඹි වැදගත් විනිශ්චයක්, විගණන මතය කරා ගමන් කිරීමේදි එළඹි නිගමනයන් පිළිබඳව විෂයමූලික ඇගයීමක් සිදු කළ යුතු වේ. මෙය කාර්යභාර තත්ත්ව පාලන සමාලෝචනයක් ලෙස හැඳින්වේ.

# තත්ත්ව පාලනයට අදාළ වන පියවර

**තත්ව පාලනය සඳහා නායකත්වයක් ලබාදීම**

විගණන ආයතනය තුලින් විගණනය භාර කාර්යභාර හවුල් කරුවකු පත් කිරීම සිදු කරන අතර, එම විගණන කාර්යේ සමස්ථ තත්ත්ව පාලනය පිළිබඳව වගකීම අදාළ හවුල් කරුවා වෙත පවරනු ලැබේ.

**අදාළ වන වෘත්තීමය අවශ්‍යතාවයන් තීරණය කිරීම**

මෙහිදි විශේෂයෙන්ම ස්වාධීනත්වය ,රහස්‍යභාවය, අවංකභාවය, අරමුණුගතභාවය, වෘත්තීමය කුසලතාවය යන ආචාරධර්ම පිළිබදව සලකා බැලිය යුතු වේ.

**සේවක දායක සම්බන්ධතා හා විගණන කාර්යන් භාර ගැනීම හා පවත්වා ගැනීම**

නව සේවාදායක සම්බන්දතා ආරම්භ කිරීමට පෙර එම සේවාදායකයා පිළිබඳ නිසි ඇගයීමක් සිදු කළ යුතු වේ. තවද දැනට සිටින සේවාදායකයා සම්බන්ධයෙන් නිරන්තර ඇගයීමක් සිදු කළ යුතුය.

**කාර්යභාර කණ්ඩායම පත් කිරීම**

විගණන කර්යභාර කණ්ඩායමට අදාල වෘත්තීමය ප්‍රමිතීන්ට හා බලපාන නීතිරීති හා රෙගුලාසීමය අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීමට නිසි ආකාර දක්ෂතාවයක්, පළපුරුද්දක් හා කුසලතාවයක් තිබේද යන්න සලකා බලා විගණන කණ්ඩායම පත්කරගෙන කාර්ය පැවරීමක් සිදු කළ යුතු වේ.

**කාර්යභාරයේ ප්‍රගතිය සලකා බැලීම**

a. මෙහිදි අදාළ විගණන කාර්යභාර හවුල්කරු තම විගණන කණ්ඩායම මෙහෙයවීමත්,(Direction),ඔවුන්ගේ වැඩ කටයුතු අධීක්ෂණයක් (Supervision),සහ සමාලෝචනයක් (Review),සිදු කළ යුතුය.

- **මෙහෙයවීමේදී**
- **අධීක්ෂණයේදී**
- **සමාලෝචනයේදී**

b. විගණන කණ්ඩායමට අවශ්‍ය උපදෙස් ලබා දීම

c. කාර්යභාර තත්ත්ව පාලන සමාලෝචනයක් සිදු කිරීම

**සමීක්ෂණය**

අදාළ විගණන ආයතනය ක්‍රියාත්මක කර ඇති තත්ත්ව පාලන පිළිවෙත් වල සඵලදායිත්වය ඒවායේ යෝග්‍යත්වය නිසි ආකාරව සමීක්ෂණය කළ යුතු වේ.

# තත්ත්ව පාලනයේ වාසි

- විගනණ අවදානම පිළිගත හැකි මට්ටමකට අඩුකර ගත හැකි වීම
- කාලය, ශ්‍රමය ඇතුලු අනෙකුත් සම්පත් නිසි ආකාර ඵලදායීතාවයකින් භාවිතා කළ හැකි වීම
- ගුණාත්මක බවින් ඉහළ සේවාවක් සේවාදායකට සැපයිය හැකි වීම
- සියලු විගණනයන් S.L.Au.S වලට අනුව කර ඇති බවට තහවුරු කර ගැනීම